## නැති පණ ලබන හැටි

'නැතිවුනු පණක් ආපසු දිය හැකි බෙහෙත කුමක්දැයි දිනක් කම්මල්කරුවෙක් වෛද ්‍යයකුගෙන් ඇසීය
වෛද්‍යයා මඳ සිනහ පහළ කෙරෙමින් 'නැතිවුනු පණක් දීමට කිසිම බෙහෙතක් මේ ලොව නැතැයි පිළිතුරු දිණි
'එහෙනම් නැතිවුණු පණ දිය හැකි කෙනෙක් ලොව සිටිත් දෘ
'එවැන්නකු සිටිතියි මම නොසිතමි
'එවැනි කෙනෙකු මම දනිමි
'ඒ කවරෙක්ද
'කම්මල්කරු''
'ඒ කෙසේද ඔබ නැතිවුණු පණ දෙන්නේ'
'වානේ වල පණ ගිය විට මට පණ දිය හැකියි'
'හා ඒක හරි ඔබ කියන්නේ වානේ ගැන මා හිතුවේ මිනිසුන් ගැනයි'
'මිනිසුන් ගැනත් ඒක එහෙමයි'
යළිත් සිනා පහළ කළ වෛද්‍යයා 'වාහන වලට සිදුවන දේ මිනිසුන්ට සිදු වුණොත් පණ යනු මිස කෙසේ පණ ලැබෙයිද?
'ඒක මම නො දනිමි එහෙත් එකක් දනිමි එනම් වානේ වලට සිදුවන හැම පීඩාවක් මටත් සිදුවන අතරම මගේ අතපය වානේ වගේ ම සවිමත් බව
'එසේ නම් එය සිදු වන හැටි බලා
ගැනීමට මම රිසියෙමි
ඔව් එන්න මගේ කම්මලට
පසු දිනෙක කම්මල්කරු වානේ අවියක් පන්නරය ලබමින් සිටියදී වෛද්‍යයා කම්මලට ආවේය
කම්මල්කරු අවියක් ගින්නෙහි ලා ගිනියම් කරනු බලා සිටි වෛද්‍යයාට ඉබේම මෙසේ කියැවිණි
'ගින්නෙන් අවියට පණ ලැබෙන හැටි පුදුමයි නේද ?
එබසට මුවෙන් නොබැණ කම්මල්කරු නැමීම් තැළීම් ආදී කළේය
'අවියට පණ දෙන්නේ ගින්න නොවේදැයි වෛද්‍යයා යළි විමසීය
නැහැ නැහැ කම්මල්කරු ගිනියම් අවිය ගෙන දියෙහි ගිල්වීය
'මට දැනුයි තේරුණේ වානේ පණ
ලබන්නේ වතුරෙන්
'නැහැ නැහැ' යි කී කම්මල්කරු මෙසේ පැවසීය 'වානේ පන්නරය ලබන්නේ
ගිනියම් වීමෙන් සිසල් විය යුතු විට සිසිල් වීමෙන් පමණක් නොව තැළීම් පෙරළීම් ආදී සියල්ලෙනමයි.
'ඔබ කීවා හරි මිනිසුන් ගැනත් ඒක එහෙමයි කියමින් වෛද්‍යයා සොම්නසින් එකග විය

**නීතීඥ එස් පී පුංචිහේවා**








